ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

Ministry of Health & Mass Media

No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


2025.02.28

| 02 | 29 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,

**පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

**ග්‍රාමීය ජනතාවට සුවසෙත සලසන "සුව උදාන" ජංගම සෞඛ්‍ය සායන වැඩසටහනේ 2025 වර්ෂයේ 5 වන වැඩසටහන පිළිමතලාව රණවන පුරාණ විහාරස්ථානයේ දී …**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවෘත්ති හා ප්‍රචාරණ අංශය මගින් සංවිධානය කරනු ලබන "සුව උදාන" ජංගම සෞඛ්‍ය සායන වැඩසටහනේ 5 වන ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කයේ පිළිමතලාව රණවන පුරාණ විහාරස්ථානයේ දී මාර්තු පළමු වනදා (01) පෙරවරු 8.30 සිට පස්වරු 2.00 දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙම ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන සෞඛ්‍ය හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය හංසක විජේමුණි මහතාගේ මෙහෙයවීමෙන් පැවැත්වෙන අතර මෙම වැඩසටහන ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නිරෝගීමත්ව පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් සංවිධානය කරන වැඩසටහනකි.

විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය, හෙද පරිපූරක වෛද්‍ය ඇතුලු සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සහභාගීත්වයෙන් පැවැත්වෙන මෙම "සුව උදාන" ජංගම වෛද්‍ය සායනය තුලින් ජංගම රසායනාගාර සේවා, දන්ත වෛද්‍ය සායනය, අක්ෂි සායනය, රුධිරයේ සීනි මට්ටම පරීක්ෂාව, රුධිරයේ මේද මට්ටම පරීක්ෂාව, ශරීර ස්කන්ධ දේහ දර්ශකය මැනීම, රුධිර පීඩනය මැනීම, සුවනාරි සායනය, ආයුර්වේද සායනය, වකුගඩු සායනය, බෝනොවන රෝග පිළිබඳ සායනය සහ චීන කටු චිකිත්සාව, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ඇතුලු වෛද්‍ය සේවාවන් රැසක් මෙන්ම ඖෂධ නිකුත් කිරීම ද මෙම ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන තුළින් සිදු කෙරෙන බව මෙම සුව උදාන ජංගම සේවය මෙහෙයවනු ලබන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ) ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත්කුමාර තෙන්නකෝන් මහතා මාධ්‍යයට කීය.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත්කුමාර තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ)
සෞඛ්‍ය අමාත්‍යාංශය

- **මෙම ප්‍රවෘත්තිය ඔබ මාධ්‍ය ආයතනයේ ප්‍රවෘත්ති විකාශ වල තීරු පටි දැන්වීමක් ලෙස ප්‍රචාරය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**